# <u>දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව</u>
## <u>කළුතර දිස්ත්‍රික්කය</u>

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **<u>මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 *දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ* මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ණයහිමි ප්‍රතිපාදන සළසා නොතිබූ රු.3,969,731 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කිරීමේදී විවිධ ණයහිමි ගිණුම හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් රු.547,602 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අඩුවෙන් බිල් කර තිබූ මුද්දර ගාස්තු නිවැරදි කිරීම ලෙස දක්වා රු.14,438,404 ක් මුද්දර ගාස්තු ගිණුම හර කර තිබුණද, මුද්දර ගාස්තු ගිණුම විශ්ලේෂණය කිරීමේදී බිල් කිරීම්වලට වඩා වැඩියෙන් ලැබීම්වල එකතුව රු.12,172,314 ක් විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.7,035,198 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.3,569,579 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

වර්ෂ 2 කට වඩා කල් ඉකුත් වූ රු.2,340,569 ක් වූ තැන්පත් ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 3,453 | 2,063 | 5,948 |
| (ii) බදු කුලී | 583 | 467 | 136 |
| (iii) බලපත්‍ර ගාස්තු | 109 | 162 | -- |
| (v) වෙනත් ආදායම් | -- | -- | -- |

2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ මස්කඩ කුලී හා කඩකාමර කුලී හිඟ ශේෂය රු.41,334 ක් ඉහත බදු කුලී ශේෂයට ඇතුළත් කර නොතිබුණි.

2.3.2 **වරිපනම් බදු**

2014 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟ ශේෂය රු.5,947,675 ක් වූ අතර විගණිත දිනය වූ 2015 පෙබරවාරි 24 වන විට ඉන් රු.1,112,252 ක් පමණක් අයවී තිබුණි. මෙම හිඟ ශේෂය තුළ රු.5,000 ට වැඩි ශේෂයක් සහිත වරිපනම් ඒකක 225 ක් වූ අතර එහි එකතුව රු.4,381,077 ක් විය.

2.3.3 **අක්කර බදු**

2014 දෙසැම්බර් 31 දින වන විට හිඟ අක්කර බදු ශේෂය රු.579,119 ක් වූ අතර ඉන් රු.1,000 ට වඩා වැඩි හිඟ ශේෂයක් සහිත අක්කර බදුකරුවන් 136 ක් විය.

2.3.4 **වෙළඳ ස්ථාන කුලී**

(අ) සපුගහවත්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා තක්සේරු වටිනාකම සියයට 5 කින් වැඩි කර තිබූ අතර ඒ සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) එහි කඩකාමර 14 න් කඩ කාමර 8 ක 2012 ජූනි මාසයේ සිට 2013 අප්‍රේල් දක්වාත්, තවත් කඩකාමරයක් 2013 සිට විගණිත දිනය වූ 2015 පෙබරවාරි වන විටත් කිසිදු බදුකරුවෙකු බදු ගෙන නොතිබුණි.

(ඇ) 2015 පෙබරවාරි 20 දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කඩකාමර 07 ක් පමණක් වෙළඳාම් සඳහා විවෘත කර තිබූ අතර කඩකාමර 02 ක් වසා තිබූ නමුත් ඒවා වෙළඳ ද්‍රව්‍ය සහිත ඒවා වූ අතර කඩකාමර 06 ක් කිසිදු වෙළඳ ද්‍රව්‍යයකින් තොරව හිස්ව පැවති බව නිරික්ෂණය විය.

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 13,717,529 |
| (ii) | මුද්දර ගාස්තු | 9,772,392 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) **පියකරු පුරවර ව්‍යාපෘතිය**

පියකරු පුරවර වැඩසටහන යටතේ නාගරික උද්‍යානය අලංකරණය සඳහා සභාව රු.497,840 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර ව්‍යාපෘතිය ඉටු කර තිබුණි.

මූලික ඇස්තමේන්තුව සංශෝධනය කිරීම හෝ අමතර වැඩ අනුමත කර ගැනීමෙන් තොරව උද්‍යාන බංකු 06 ක් 2014 සැප්තැම්බර් 05 දින රු.143,975 කට මිලට ගෙන සවි කර තිබුණි. 2015 පෙබරවාරි 26 දින කාර්මික නිලධාරී සමග සිදු කළ භෞතික පරීක්ෂාවේදී බංකු 02 ක ස්ථාන 06 කින් පදම් ලීය පුපුරා ගොස් තිබූ අතර බංකුවේ යකඩ කොටස්වල මල බැඳ තිබුණි. මෙම බංකු හොඳ ප්‍රමිතියෙන් පවතින බවට ගෙවීම් කිරීමේදී සහතික කර නොතිබුණි.

(ආ) **799 C 300 ඇලදූව ඔරුව තිබ්බගොඩ මාර්ගය**

මග නැගුම ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ රු.500,000 ක් වූ ඇස්තමේන්තුවකට ඉහත මාර්ගය කුට්ටි ගල් අතුරා තිබුණි. ඇස්තමේන්තුව අනුව මාර්ගයේ දිග මීටර් 86 ක් හා පළල මීටර් 2.5 ක් විය. කොන්ත්‍රාත්කරු විසින් 2014 දෙසැම්බර් 07 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කර තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 පෙබරවාරි 26 දින මාර්ගය තාක්ෂණ නිලධාරී සමග භෞතික පරීක්ෂාවේදී වර්ග මීටර් 1 ½ බැගින් වූ ස්ථාන 04 කින් මාර්ගයේ ගල් ගිලා බැස තිබුණි. එසේ වුවද ඇස්තමේන්තුවේ අයිතම අංක 1-2 අනුව මාර්ගය මට්ටම් කර සැකසීම වෙනුවෙන් රු.20,079 ක් ඇස්තමේන්තු කර තිබූ අතර තාක්ෂණ නිලධාරීගේ ගෙවීම් වාර්තා අනුව ඉහත කාර්ය වෙනුවෙන් රු.19,500 ක් නිර්දේශ කර තිබුණි. සභාවේ තාක්ෂණ නිලධාරී ඉදිරියේ මාර්ගය දෙපස පදිංචි නිවැසියන් විසින් ප්‍රකාශ කර සිටියේ පාර ඉදි කිරීමේදී තැලීමක් සිදු කිරීමකින් තොරව ගල් ඇල්ලූ බවත් වර්ෂාවකදී පාර ගිලා බැස ඇති ස්ථානවල පයින් ගමන් කළ නොහැකි තරමට වර්ෂා ජලයෙන් පිරෙන බවත්ය.

(ii) මග නැගුම උපදෙස් මාලාව පරිදි දෙපස අන්තරාදායක නොවන සේ මාර්ගයේ උරහිස් මට්ටමට පස් පිරවිය යුතු වුවත් සම්පූර්ණ දිගින් මීටර් 35 ක පමණ ප්‍රමාණයක පොළව මාර්ගයේ උරහිස් මට්ටමට තිබූ අතර ඉතිරි ප්‍රමාණයෙහි මාර්ගය දෙපස උරහිස් හිස්ව පැවතුණි. මේ අනුව එම කාර්යය සිදු කර තිබුණේද යන්න ගැටළු සහගත වූ අතර අවසන් ගෙවීම් වාර්තාව අනුව ඒ සඳහා රු.5,000 ක් නිර්දේශ කර තිබුණි.

(ඇ) **<u>අංක 719 A ඇඹිලවි වත්ත මාර්ගය</u>**

මග නැගුම ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ රු.500,000 ක් වූ ඇස්තමේන්තුවකට ඉහත මාර්ගය කුට්ටි ගල් අතුරා තිබුණි. ඇස්තමේන්තුව අනුව මාර්ගයේ දිග මීටර් 86 ක් හා පළල මීටර් 2.5 ක් විය. කොන්ත්‍රාත්කරු විසින් 2014 දෙසැම්බර් 02 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කර තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ගයේ කුට්ටි ගල් ඇල්ලීමේදී මාර්ගය මට්ටම් කර තැලීම වෙනුවෙන් රු.20,078 ක් ඇස්තමේන්තු කර එම ප්‍රමාණයම ගෙවීමට නිර්දේශ කර තිබුණද ව්‍යාපෘතිය අවසන් වී මාස 02 ක් තුළ ස්ථාන කිහිපයක ගල් උඩට මතු වී තිබුණි.

(ii) ගල් කුඩු ඇතිරීම වෙනුවෙන් රු.38,111 ක් ගෙවීම නිර්දේශ කර තිබුණද ඒවා ප්‍රමාණවත් පරිදි යොදා නොතිබුණි.

(iii) අවසන් ගෙවීම් වාර්තාවේ විෂය අංක 2.7 අනුව දෙපස පස් පිරවීම වෙනුවෙන් රු.5,000 ක් ගෙවීමට නිර්දේශ කර ඇතත් පළමු මීටර් 34.3 දක්වා එසේ පස් පුරවා නොතිබුණි. එමෙන්ම දෙවන මීටර් 51 දී මාර්ගය දෙකෙලවර දක්වාම ගල් අල්ලා උරහිස් බැම්ම යොදා තිබීම නිසා එහි පස් පිරවුමක් අවශ්‍ය නොවීය.

(iv) ඉහත පළමු මාර්ගය පරිදිම මෙහිද ප්‍රවාහන ගාස්තු වෙනුවෙන් රු.28,810 ක් ඇස්තමේන්තු කර, ගෙවීම් සඳහාද නිර්දේශ කර තිබුණි. නමුත් උක්ත මාර්ගය ප්‍රවාහන අපහසුතා සහිත මාර්ගයක් නොවන බව නිරීක්ෂණය විය.

3.2 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) 1981 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා සහ 2011 වර්ෂයේ පිළිවෙලින් ගෙවා තිබූ රු.173,523 ක් හා රු.2,000 ක් වූ අත්තිකාරම් මුදල් විගණිත දිනය වූ 2015 අප්‍රේල් 30 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තොග අයිතම 9 ක ඒකක 1899 ක ඌනතාවය සම්බන්ධයෙන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3.3 **<u>ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන</u>**

2014 වර්ෂය තුළ මෙම වැඩසටහන සඳහා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රු.3,000,000 ක් ලබා දී තිබුණි. සති පොළ, කැලිකසල කළමනාකරණය, කාණු පද්ධති, අතුරු මාර්ග, ළමා උද්‍යාන, පොදු සනීපාරක්ෂක හා වැසිකිලි පහසුකම් වැනි ප්‍රජා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම වැඩසටහනේ අරමුණ වූ අතර විගණිත දිනය වූ 2015 පෙබරවාරි 24 වන විට රු.2,506,043 ක් වියදම් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැඩසටහනේ අරමුණට පටහැනිව වාහන අළුත්වැඩියාව, වාහන සඳහා ටයර් මිලට ගැනීම, වාහන සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.1,646,165 ක් වැය කර තිබුණි.

(ii) ට්‍රැක්ටර් 2 ක් සඳහා රු.170,400 කට මිලදී ගෙන තිබූ ටයර් 4 ක් විගණිත දිනය වූ 2015 පෙබරවාරි වන විටත් සවි කර නොතිබුණි.

(iii) ටයර් මිලදී ගැනීම සහ වාහන උපාංග මිලදී ගැනීම ලේඛනගත කර නොතිබුණි.

### 3.4 <u>වාහන පාලනය</u>

2014 වර්ෂය තුළ JCB යන්ත්‍රය සඳහා අළුත්වැඩියා වියදම්, ආදායම් බලපත්‍ර හා රක්ෂණ ගාස්තු සඳහා රු.1,168,569 ක්ද, ඉන්ධන ලීටර් 5520 ක් සඳහා රු.657,448 ක්ද වැය කර තිබූ අතර යන්ත්‍රය 2014 වර්ෂය තුළ මීටර් පැය 9918 ක් ධාවනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2014 වර්ෂය තුළ JCB යන්ත්‍රයෙහි ධාවන සටහන් පරීක්ෂාවේදී යන්ත්‍රය ඉහත සඳහන් මීටර් පැය 9918 ම සභා බල ප්‍රදේශයේ කාණු කැපීමට සහ මාර්ග සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන තිබූ නමුත් ඒ සඳහා ඇස්තමේන්තු සහ ඉදිරි වැඩ සැළසුම් පිළියෙල කර නොතිබුණි.

(ii) මාර්ග සංවර්ධන කටයුතු සිදු කිරීම ලෙස ධාවන සටහන්වල ලියා තිබූ සමහර ව්‍යාපෘතීන් 2014 වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණද, ධාවනය කළ මීටර් පැය සටහන් කර ඉන්ධන ලබාගෙන තිබුණි.

(iii) කොන්ත්‍රාත් පදනම මත ලබාදී තිබූ ව්‍යාපෘතිවලට අදාල මාර්ගය සංවර්ධනය කිරීම ලෙස ධාවන සටහන්වල ලියා තිබූ අතර ඒ වෙනුවෙන් කිසිදු කුලී අයකිරීමක් සිදු කර නොතිබුණි.

### 3.5 <u>කාර්යසාධනය</u>

මග නැගුම මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ 2013 වර්ෂයේ අනුමත කර තිබූ ව්‍යාපෘති 06 ක් 2014 වර්ෂය සඳහා අවිච්ඡේද කර තිබුණි. එසේම 2014 වර්ෂයේ අනුමත කර තිබූ ව්‍යාපෘති 158 ක්ද, එම වර්ෂයේ ඉටු නොකිරීම නිසා 2015 වර්ෂය සඳහා අවිච්ඡේද කිරීමට සභාව විසින් වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර තිබුණද විගණිත දිනය වූ 2015 පෙබරවාරි 26 වන විටත් ඒවා අනුමත කර එවා නොතිබුණි.

## 4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වාහන උපයෝජනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය